# ශ්‍රී ලාංකේය භික්ෂූන් වහන්සේගේ දේශපාලන භූමිකාව

ගාල්ලේ ධම්මින්ද හිමි

## මහින්දාගමනය දේශපාලන ඇසින්

භික්ෂූන් වහන්සේ හා දේශපාලනය' වනාහි එකිනෙක අසමාන පීලි සහිත කෝච්චි පාරක් වැනිය. රේල් පීලිවල අසමාන වීම හෝ අසමබරතාව අනතුරුදායක බව නොකිව මනාය. එලෙසම භික්ෂුව හා දේශපාලනය නමැති රේල් පාර අසමබරවීම දුම්රිය නමැති සාමාන්‍ය මහජනතාවගේ ජීවිත අවධානමකට ලක්කිරීමකි. එම අවධානම මග හැරිය හැක්කේ නිසි ක්‍රමවේදයකට නිම කළ රේල් පීලි සවිකොට දුම්රිය ගමන විවෘත කිරීමෙන් පමණි.

උක්ත මාතෘකාව සම්බන්ධයෙන් අප දරන මතය විචාරයට හා විමර්ශනයට යොමු කෙරෙන්නේ එහි ඓතිහාසික සාක්ෂ්‍ය මගින් නූතන භික්ෂු දේශපාලන ගමන්මග දක්වාම විවරණයක් ද කිරීමෙනි. මෙහිදී අවධානය යොමුවන තවත් කරුණක් නම් දේශපාලනය, පක්ෂ දේශපාලනය හා නිර්පාක්ෂික දේශපාලනය ලෙස දෙවැදෑරුම් බවයි. ඇරිස්ටෝටල්ට අනුව මිනිසා උපතින්ම දේශපාලනික සත්ත්වයෙකි. මෙම 'සත්ත්ව' වර්ගීකරණයට භික්ෂුව අදාළ වීම හෝ නොවීම අප මාතෘකාවට දක්වන්නේ සමීප සබඳතාවකි.

ලාංකේය භික්ෂු දේශපාලනයේ පළමු කැපී පෙනෙන ඍජු මැදිහත්වීම මිහිඳු මහරහතන් වහන්සේ විසින් සිදුකරනු ලැබීය. උන්වහන්සේ මෙසිරිලක සිදු කළේ එක්තරා ආකාරයේ දේශපාලනයකි. එය නිර්පාක්ෂික, අගතිගාමී නොවූ ශුද්ධ දේශපාලන ව්‍යාපාරයකි (Sacred Political Campaign). මහලු මුටසීව රජ දවස හෙළදිවට නොවැඩි ඒ හිමියෝ තරුණ හා කායශූර තිස්ස රජ දවසම වැඩියහ. උන්වහන්සේ හැමවිටම කටයුතු කළෝ, පූර්

න්‍යාය පත්‍රයකට අනුවය. චූළහත්ථිපදෝපම සූත්‍රයේ පටන් දේශනා කළ සියලු සූත්‍ර දේශනාවල සාරය විචාරක්ෂියෙන් බලන කල අවබෝධ වන්නේ, දීර්ඝ කාලීන සැලසුමකට අනුව වඩා සෞභාග්‍යවත් හා ශිෂ්ටකාමී දේශයක් ගොඩනැගීම උන්වහන්සේ සතුව පැවති අභිප්‍රායයක් බවයි. ඒ සඳහා භික්ෂුවක ලෙස ආධ්‍යාත්මික උපදේශක කාර්‍ය්‍ය වඩා නිවැරදිව සිදු කළහ. උන්වහන්සේගේ දේශපාලනය දායකත්වය වඩා අර්ථවත් වූයේ තථාගත ධර්‍මයේ ආලෝකයෙන් ඉදිරිය දුටු නිසාවෙනි. වරක් දෙවනපෑතිස් රජ විමසන්නේ: ස්වාමීනි දැනුදු මාගේ රාජ්‍යයේ ධර්‍මය ස්ථාපිත වීද? එවිට මිහිඳු හිමියන්ගේ පිළිතුර වූයේ හෙළදිව බුදුසමය මුල්බැසීමට නම් මේ දේශයේ වැසියෙකු පැවිදිව උපසම්පදාව ලබා පළමුව විනය දේශනාවක් සිදු කළ යුතු බවය. (ම.ව. 15 පරි.) ඒ අනුව අරිට්ඨ මහාමාත්‍යගේ පැවිදි වීමත් සමග උන්වහන්සේ විසින් හෙළදිව වැසි භික්ෂූන් වහන්සේට විනය දේශනා කිරීම සිදුකෙරුණු අතර මෙම සිදුවීම අතිශය ප්‍රබල සිදුවීමක් බව අප හැඟීමයි. මන්දයත් මෙම ඓතිහාසික ශාසනික සිදුවීමෙන් මතුව පෙනෙන ලක්ෂණ දෙකකි. පළමුවන ලක්ෂණය නම් හෙළදිව වැසියෙකුගේ පැවිදිවීමෙන් මෙරට සසුනේ ස්ථාවරත්වය සහතික කළ හැකිය යන්නය. මෙමගින් ගම්‍ය වන්නේ, මිහිඳු හිමියන් විදේශිකයෙකු වුව ද, ස්වදේශික ජනයාගෙන් යම් දේශයක ශිෂ්ටාචාරයක් මුල්බැසගන්නා බව නොවේද? අරිට්ඨ හිමියන්ගේ විනය සජ්ඣායනාව දෙවන ලක්ෂණයයි. විනය නම් ශාසනයාගේ ආයුෂයයි. උන්වහන්සේට පර්යාප්ති ශාසනයේ සූත්‍ර හා අභිධර්‍මය දේශනා කරන්නට තිබිය දී විනය දේශනා කිරීම අතිශයින් ම සැලකිල්ලට ලක්විය යුතු කාරණාවකි. මින් කියැවෙන්නේ හෙළදිව වැසි භික්ෂුවගේ මහණ උපසම්පදාවෙන් ස්ථාවර වූ මෙම භූමිය, විනය මගින් ආයුෂ අපේක්ෂා කරන බව නොවේද?

මිහිඳු හිමියන්ගේ නිර්පාක්ෂික දේශපාලනය ලෙස අප හඳුනාගත්තේ උක්ත සංසිද්ධීන්ය. එය වර්තමාන දේශපාලන භාවිතය සමග කලවම් කර ගනිමින් විමසීම නොකළ මනාය. අප කියන්නේ මෙරට භික්ෂුවට අවශ්‍ය දේශපාලන සුජාතභාවය පළමුව ලැබුණු අවස්ථාව මහින්දාගමනයෙන් පසුව බවයි.

රාජකීය නිලධර මණ්ඩලයේ මහාමාත්‍ය වැනි තනතුරක් දැරූ අරිට්ඨ වැනි රාජකීය නිලධාරියෙකුගේ පැවිදිවීම ජාතියක් ලෙස, සිදුවීමක් ලෙස හා ඇගයීමක් ලෙස එකල ඉහළ ජනප්‍රියත්වයක් ලැබූ ප්‍රවෘත්තියක් විය යුතුමය.

අතීත ලාංකේය දේශපාලන භූමිකාව පිළිබඳ හමුවන පැරණිතම සාක්ෂ්‍ය සටහන වන්නේ මිහිඳු හිමියන්ගේ නිර්පාක්ෂික දේශපාලන න්‍යාය හා භාවිතයයි. මෙතැන් සිට ලාංකේය සමාජ දේශපාලන ක්‍රියාවලියේ භික්ෂු භූමිකාව සැලකිය යුතු මට්ටමක ඉහළ වටිනාකමක් ලබාගත් බව නොරහසකි. එහි උච්චතම අවස්ථාව අනුරාධපුර රාජධානි අවධිය වශයෙන් සැලකීම අවිවාදිතය. මිහිඳු හිමියන්ගේ ධර්මාවවාද මගින් න්‍යායට අවශ්‍ය පන්නරය ලැබුණු අතර අරිට්ඨගේ පැවිද්දත් සමග එම න්‍යායයෙහි භාවිතයට අවශ්‍ය මානව සම්පත ද ලැබෙන්නට විණි. බුදුදහම රාජ්‍යාගම (State Religion) ලෙස සංස්ථාපිත වන්නේ දෙවනපෑතිස් රජ අත පැන් වත්කොට මහාමේඝවර්ණ උද්‍යානය සඟ සතු කිරීමත් සමගිනි. විචාරක මතවාදවලට අනුව මහින්දාගමනයට පෙර හෙළදිව වැසියන් තථාගත ධර්මයේ ආභාසය ලබා තිබුණත් රාජ්‍ය අනුග්‍රහය නොලැබීමෙන් ඉදිරියට ගලායාමක් හෝ සංවිධානගත වීමක් සිදුනොවුණි. රාජ්‍යයේ වගකීම් දරන්නා ලෙස දෙවනපෑතිස් රජ තම රාජකීය උද්‍යානය මහාසංඝයාට පූජා කිරීම ඓතිහාසික සිදුවීමක් වන්නේ මේ නිසාවෙනි. එය බුදුසමයට ස්ථිර වාසභූමියක් ලබාදීම වැනිය. මහාවංසය දක්වන පරිදි ඉනික්බිතිව මෙම භූමියේ බුදුසමය ස්ථාවරත්වයට පත්වුණි. බුද්ධඝෝෂ අටුවාචාරීන් වහන්සේ දක්වන 'සීමා බන්ධන කතාව' මෙම මහාවංස ප්‍රකාශය සමග පරස්පරතා නොදක්වන්නේ සංඝ විනයට අදාළ තත් කාරණාවත් සීමා බන්ධයත් සමග සමරූපී වන නිසාත්, සීමා බන්ධනය මහාමෙවුනා උයන් බිමේ සිදු වූ නිසාත් යන තාර්කික පදනම මත සලකාගෙනය. අප ප්‍රස්තුතයට අවශ්‍ය මූලාධාරක සැපයෙන්නේ ඉහතින් සාකච්ඡා කළ ඓතිහාසික සංරචනාවත් සමගිනි. ඉන් අප මතුකර දක්වන ප්‍රධාන තර්ක කිහිපයකි.

01. බුදුසමය (දහම) මෙරට රාජ්‍යාගමයි.
02. මිහිඳු හිමි මෙරට ප්‍රථම රාජ්‍ය නායක උපදේශකයා විය.
03. අරිට්ඨ හිමි මෙරට ප්‍රථම ස්වදේශික භික්ෂුවයි.
04. දෙවනපෑතිස් රජ පළමු බෞද්ධ රාජ්‍ය නායකයා විය.
05. භික්ෂු විනය අන් හැම එකකටත් වඩා ඉහළින් පැසසීම (විනය සංගායනාව, ථූපාරාමය)
06. රාජ්‍ය පාලනයට ඍජුව දායක වූ පළමු ලාංකේය නිර්පාක්ෂික භික්ෂුව නම් මිහිඳු මහරහතන් වහන්සේය.

මෙතැන් සිට අප අවධානය යොමුවන්නේ මහින්දාගමනයෙන් පසු එළඹෙන රාජ්‍ය ක්‍රමයේ යම් යම් සන්ධිස්ථාන මතු කරමින් භික්ෂු දේශපාලනයේ නූතන භූමිකාව කරා සාකච්ඡාව මෙහෙයවීමටයි.

පූජාවලිය, සද්ධර්මාලංකාරය වැනි පුරාතන සාහිත්‍ය කෘතිවල දැක්වෙන පරිදි මෙරට රාජ්‍ය පාලකයා සම්‍යක්දෘෂ්ටික අයෙකු විය යුතුය. එසේම නිශ්ශංකමල්ල රජුගේ අභිලේඛන සාක්ෂ්‍යවලට අනුව සිරිලක බුද්ධාගමේ පහසින් බුද්ධදේශයක් බවට පත්වුණි. රාජත්වයේ සංකේතය බඳු ශ්‍රී දන්ත ධාතුන් වහන්සේ පවා වැඩසිටියේ රජ මාළිගයට ඉතා නුදුරේය. ඒ අනුව රට, එරටේ පාලකයා හා රට වැසියන්ද පරමාදර්ශී (Ideal) භාවිතයක සිට පාලනයත්, නිෂ්පාදන ක්‍රියාවලියත් ඉදිරියට පවත්වාගෙන යා යුතු බව මින් හැඟේ. සමස්ත රාජ්‍යයේම සංසරණය වන රුධිරය බවට පත්වූයේ බෞද්ධත්වයයි. එම රුධිර සංසරණ පද්ධතියේ සජීවී මෙහෙයුම්කරුවා වූයේ බෞද්ධ භික්ෂුවයි. භික්ෂුවගෙන් තොර රටක් රාජ්‍යයක් ගැන පාලකයාටත් පාලිතයාටත් සිතන්නටවත් අවකාශයක්වත් නොලැබුණේත් මෙම ඓතිහාසික බන්ධනය නිසාවෙනි.

**භික්ෂු දේශපාලනයේ ඓතිහාසික සලකුණු කිහිපයක්**

නිශ්ශංකමල්ල රජුගේ උතුරු වාසල අභිලේඛනයට අනුව 'අපක්ෂපාත රජෙකු ලැබීම බුදුවරයෙකු ලැබීම තරම් සමානය.' එලෙස රාජකීයත්වයට එහා යමින් නික්ලේශී උතුමෙකුට මෙන්

ගෞරවාදරයට පත් වූ රජුන් පිළිබඳ ඓතිහාසික පුරාවිද්‍යාත්මක වාර්තා අපමණය. සිව්වැනි මහින්ද (ම.ව. 54 පරි.) සිරිසඟ බෝ (ම.ව. පරි. 13,18,19) බුද්ධදාස (ම.ව. පරි.37.109) දෙවැනි උපතිස්ස (ම.ව. පරි.37.180) පළමු අග්බෝ (ම.ව. පරි.46.37) ආදිය උදාහරණ ලෙස දැක්විය හැකිය. ඉහතින් දක්වන ලද්දේ අල්ප ප්‍රමාණයක ලැයිස්තුවකි. මහාවංසයේ පටන් අභිලේඛන දක්වා ම සියුම්ව පිරික්සන්නෙකුට මෙම කරුණ අවබෝධ කොට ගත හැකිය. රජවරුන් තමන් විසින්ම රාජකීයත්වයට එහාගිය ශුද්ධත්වයක් ආරෝපණය කරගත් අතර, සාමාන්‍ය ජනතාව ද එම ශුද්ධත්වය රජුට ලබානොදුන්නා යැයි කිවනොහැකිය. ම.ව. 47-37 පරිච්ඡේදවලට අනුව පළමුවන අග්බෝ රජුගේ අභාවයෙන් ඔහුගේ දරසෑයේ අවශේෂ වූ අළු ඖෂධ වශයෙන් පාවිච්චියට පවා ගෙන ඇත. මෙම පූජනීයත්වය රජවරුන්ට ලැබුණේ රාජකීයත්වය නිසා නොව තමන් විසින් ධර්මයේ යෙදීමෙන් උපයාගත් දෑ හා ශාසනය වෙනුවෙන් නොපිරිහෙලා ඉටු කළ යුතුකම් ආදිය පදනම් කරගෙනය. මේ සෑම අවස්ථාවකදීම ලාංකේය භික්ෂුව ඉතා සමීපයේ සිටිමින් අවවාද කළේය. මග පැහැදිලි කර දුන්නේය.

ඓතිහාසික මූලාශ්‍රයවලට අනුව, බොහෝ රජවරු භික්ෂූන්ගෙන් උගත්හ. සංඝමිත්‍ර තෙරුන් ගෝඨාභය රජුගේ දරුවන්ගේ ආචාර්යවරයා වූ අතර, ගාමිණී, මහාසෙන්, වළගම්බා ආදි බොහෝ රජවරු ගුරුහරුකම් භික්ෂූන්ගෙන් ලබාගත්හ. ගුරුවරයාගේ භූමිකාවෙන් ඔබ්බට ගොස් උපදේශක තත්ත්වයෙහිලා කටයුතු කළ භික්ෂූන් ද දක්නට ලැබුණි. මානාභරණ අමාත්‍ය වට්ටගාමිණී අභය (ක්‍රි.පූ.89-77) සද්ධාතිස්ස (ක්‍රි.පූ. 137-119) ආදි රාජ මහාමාත්‍යාදීන්ගේ කාලවල සිදු වූ සංසිද්ධීන් අධ්‍යයනය කරන්නෙකුට එම කරුණු පසක් කරගත හැකිය. සරලව පවසනවා නම් රජුන් තැනීමේ බලය ලැබුවේ භික්ෂූන් පමණි. ඇතැම්විට සම්ප්‍රදාය පවා අතික්‍රමණය කරමින් අනුප්‍රාප්තිකයා නිර්දේශ කිරීම භික්ෂූන් සතුව පැවති අධිකාරිත්වයට උදාහරණ වේ. අපට හැඟෙන ආකාරයට භික්ෂු දේශපාලනය නම් මෙම ස්වභාවයයි. රට කරවීමට අවශ්‍ය උපදේශක කාර්‍යය, ඉතිහාසය මගින් භික්ෂුවට ලබාදුන් වරප්‍රසාදයකි. එය වරදානයක් ලෙස සලකා අවභාවිත

කිරීමට යාමෙන් උල්ලංඝණයට ලක්වූයේ මෙතෙක් පැවැති අලිඛිත නීතිමය වරප්‍රසාදයයි. එම තත්ත්වය අනුරාධපුර යුගයේ සතරවන කසුප් රජුගේ අවධිය වන විටත් ආරම්භව පැවතුණි. එසේ ගලා ආ ඉතිහාසයේ භික්ෂුව තමා සතු 'රජුන් තැනීමේ' බලය උපරිමවත්, අවමවත් ප්‍රයෝජනයට ගත් ආකාරය පිළිබඳ ඓතිහාසික මූලාශ්‍රය මගින් පිරිසා විමසිය හැකිය. අප ප්‍රස්තුතය නූතන භික්ෂු දේශපාලන භූමිකාව සමග සම්බන්ධ කටයුතු බැවින් ඓතිහාසික රචනයක් බවට පත්වීමෙන් පරෙස්සම් වන්නෙමි.

කෝට්ටේ යුගය අවසාන වනවිට ක්‍රි.ව. 1505 සිදු වූ පෘතුග්‍රීසි ආක්‍රමණය, 1662 දී සිදු වූ ලන්දේසි ආක්‍රමණය හා 1796 සිදු වූ ඉංග්‍රීසි ආක්‍රමණය යන ත්‍රිවිධ යුරෝපීය ආක්‍රමණ මගින් භික්ෂුව සතුව පැවති දේශපාලන අධිකාරිත්වය, පූජනීය පිළිගැනීම හා ගාමක බලවේගකර තත්ත්වය යම් තරමක් දුරට දෙදරීමකට ලක්වූ බව අප හැඟීමයි. ඉතිහාසයේ අන් කවරදාකටත් වඩා බෞද්ධ බලය අභියෝගයට ලක් කිරීමට යුරෝපීය ආක්‍රමණ සමත්විණි. ඔවුහු විහාරස්ථානවලට ලබාදුන් නින්දගම්, දේපල රජයට පවරාගත්හ. උපදේශකත්වය සඳහා භික්ෂූන් වෙනුවට අන්‍ය ලබ්ධික පැදිලිවරුන්, පිටරැටියන් බඳවාගත්හ. ගස්කොන්, ජෝන් ඩොයිලි, අන්තෝනියෝ බරෙත්තු, දෝන් දුවන් අරික්කු, සෙබස්තියන් ද වාවුස්, මනුවෙල් ලුවිස් ප්‍රැන්සිස්කානු, මැනුවෙල්ද සූසා කුතිඤ්ඤො ආදි විදේශීය උපදේශකවරුන්ගේ ඍජු මැදිහත්වීම් පිළිබඳ ඓතිහාසික තොරතුරු එමටය. ලන්දේසි යුගයෙන් පසුව එළඹෙන ඉංග්‍රීසි යුගයේදී මෙම තත්ත්වය නරකටම නරක් වී හමාරය. 1815 මාර්තු 15 වැනිදා මහනුවර ඓතිහාසික මගුල් මඩුවේදී ලියැවිල්ලක් මගින් තම දේශයේ ස්වාධිපත්‍ය නොරටුන්ට පවරා දෙන්නට වූයේ, එම භික්ෂු දේශපාලනයේ මැදිහත්වීමේ හීනතාව, සිංහලයා අතරම පැවති බලකාමය, අසමගිය හා අදූරදර්ශී පාලන ක්‍රමය ආදි සත්‍ය හේතු නිසාවෙනි. සිංහල නායකයෙකු සොයමින් තිඹිරිගෙය නූපන් රජෙකු ගැන සිහින මැවූ සිංහලයෝ යටත්විජිතකරණය නිසා කබලෙන් ලිපට වැටුණාහ. මෙම පීඩන තත්ත්වයේ උච්චතම අවස්ථාව 1818 ඌව වෙල්ලස්ස නිදහස් සටනයි. ඇතැම් පරගැති විචාරකයන්ට එය අරගලයක් (Strugle)

වූවාට එය නිදහස් සටනකි. 1815 උඩරට ගිවිසුම් අත්සන්කොට පන්හිදේ තීන්ත වියෙලෙන්නටත් පෙර, වසර 3ක් අවෑමෙන් සිංහලයෝ අවදි වූහ. යටත් විජිත රාජ්‍යයට එරෙහිව අරගල කළහ. ඓතිහාසික වාර්තාවලට අනුව මෙම සටන මෙහෙය වූවෝ භික්ෂූහුය. එසේම රාජකීය වංසක්කරුවෝය. උඩරට ගිවිසුමෙන් වසර තුනක් ගෙවී ගිය තැන එනම් 1818 යටත් විජිත ආණ්ඩුවට එදිරිව සිංහලයන් පාරට බහින්නේ වසර ගණනාවක් ඒ සඳහා සූදානම් වීමෙන් ඉනික්බිතිවය. ගෙවී ගිය වසර තුන (1815-18) සංවිධානගත වීම සඳහා ද 1818 එම විරෝධය දොරේ ගලා ගිය අවස්ථාව ලෙස ද සැලකීම යුක්ති යුක්තය.

### 1818 නිදහස් සටනේ භික්ෂු දේශපාලනය

1818 සිංහලේ විමුක්ති සටනේ මගපෙන්වීම හා පූර්ව න්‍යායපත්‍රයේ පරම අයිතිකරුවා වූයේ වාරියපොල ශ්‍රී සුමංගල හිමියන්ය. උන්වහන්සේ, 1815 මාර්තු 13 දින අත්සන් කරන්නට යෙදුණු උඩරට ගිවිසුම ජනගත කිරීමටත් ප්‍රථම සුද්දන් විසින් ඔසවන ලද බ්‍රිතාන්‍ය ධජය බිමදමා පාගා සීහනාද කළ එකම හිමිනම ද වන්නේය. එතැන් සිට අවස්ථාවක් ලද සැණින් සුදු අධිරාජ්‍ය බිඳ දැමීම උන්වහන්සේගේ අභිප්‍රාය වන්නට ඇත. 1818 විමුක්ති සටනේ ප්‍රතාපවත් පෞරුෂය වීර මොනරවිල කැප්පෙටිපොල වන අතර එහි පූජනීය සලකුණ නම් වාරියපොල හිමියන්ය. උන්වහන්සේ මහනුවර නගරයේ වැඩ සිටිමින් (මහනුවර සුදුහුම්පල විහාරයේ) යටත් විජිත පාලනය මගින් බුදුදහමට සිදුකරන විනාශය පිළිබඳ ශෝකයට පත්වූහ. සුදු පාලකයන් ද සිටියේ උන්වහන්සේ ගැන විමසිල්ලෙනි. 1818 නොවැම්බර් මස පළමු වැනි දින නුවරකලාවියේදී අත්තඩංගුවට පත් වූ උන්වහන්සේ යාපනය සිරකඳවුරේ ජීවිතාන්තය දක්වා සිරගෙට නියමකොට ලදුයෙන් 1821 දී වයස්ගත බැවින් සමාවක් ලැබ, ඉන් වසර දහයකට (10) පසුව අපවත් වී වදාළහ. අදටත් වාරියපොල ශ්‍රී සුමංගල නාමය මෙම දෙරණේ රැව් පිළි රැව් දෙන්නේ උන්වහන්සේගේ දේශපාලන නිසා මිස මහණකම නිසා නොවේ. දේශපාලනයත් මහණකමත් වරද්දානොගත් ඒ හිමියෝ

දේශය පාලනය කරන්නට නව චින්තනයක් ලබා දුන්හ.

උඩරට ගිවිසුමේ වගන්ති ප්‍රකාරව බ්‍රිතාන්‍යයෝ කටයුතු නොකළහ. විශේෂයෙන් එහි 05වන වගන්තියෙන් ප්‍රකාශ වන බුද්ධාගම ආරක්ෂා කිරීම වෙනුවට ඔවුහු කතෝලික පල්ලි ඉදිකොට මිෂනාරී අධ්‍යාපනය මගින් ආගම ව්‍යාප්ත කළහ. මහනුවර සෙංකඩගල සිට සූරියගොඩ විහාරයට වැඩම කළ භික්ෂුවක විසින් ලියන ලදැයි සම්මත (මෙම පද්‍ය කුංකුනාවේ හිමියන් විසින් විරචිත බවක් ද සැලකේ) අද පවා ප්‍රකට මෙම කවි පංතිය ප්‍රකාශ කරන්නේ යටත් විජිත පාලකයන් බෞද්ධාගම වෙනුවෙන් කිසිදු සැලකිල්ලක් නොදැක්ක වූ බව නොවේද?

''අනේ කුහුඹින් නේ
තොපටත් රජෙක් ඉන් නේ
මොක දෑ කරන් නේ
අපේ කරුමේ අපට වන් නේ

රජෙක් ලැබුණෝ තින්
එදා කිරිබත් කන් නන්
පෙරහැර කරන් නන්
සාදු නාදෙන් ගිගුම් දෙන් නන්''

එපමණක් නොව 1818 නිදහස් සටනට පෙර සිටම යටත් විජිත රාජ්‍ය පාලනයට විරෝධතා දැක් වූ ඉහගම සහ පොල්වත්තේ භික්ෂු දෙනමට ද චෝදනා එල්ල කරමින් ඔවුහු ද සිරභාරයට පත් කළහ. ක්‍රි.පූ. 03වන සියවසේ සමාජ, ආර්ථික පසුබිම ක්‍රි.ව. 1800 දී අපේක්ෂා කළ නොහැක. එනිසා භික්ෂු ක්‍රියාකාරිත්වය ද කාලානුරූපිව සකස්වීම සාමාන්‍ය ස්වභාවයකි. එහිදී වඩා වැදගත් වන්නේ තම ජාතිය, ආගම වෙනුවෙන් කටයුතු කිරීම බව එම ජාතියෙන් පෝෂණය ලද භික්ෂුවට වුවද අදාළ වේ. එම ක්‍රියාව උතුම් මහණකමේම කොටසක් ලෙස සැලකිය හැක්කේ අගතිගාමී නොවී නිර්පාක්ෂිකව කටයුතු කිරීමෙනි.

## 1848 නිදහස් සටනේ භික්ෂු දේශපාලනය

1848 නිදහස් සටන බ්‍රිතාන්‍ය පාලනයට එදිරි දෙවන මෙහෙයුමයි. 1818 කැරැල්ල නිසා අතිශය මර්දනයට ලක්වූ සිංහලයෝ රහසේ සංවිධානය වූහ. 1822 දී නැවත යම් ප්‍රමාණයක සැලකිය යුතු කැරැල්ලක් මාතලේ ඇතිවිය. මේ සම්බන්ධයෙන් වරදකරුවෙකු කොට කහවත්තේ උන්නාන්සේ අත්තඩංගුවට ගැනිණි. එසේ වුවත් සාක්ෂ්‍ය ඔප්පු කිරීමට අසමත් වූ ඉංග්‍රීසීන්ට සිරකරුවන් නිදහස් කිරීමට සිදුවුණි. සමකාලීනව නුවරඑළිය ප්‍රදේශයේ ඇති වූ කැරැල්ල මෙහෙය වූයේ යැයි චෝදිත, චන්ද්‍රගුප්ත සීලවංස සරණංකර නම් භික්ෂුවක් ද අත්තඩංගුවට ගැනිණි. මර්දනය හමුවේ නොසැලුණු නිදහස්කාමීහු නැවත නැවත රැස්වූහ. සංවිධානය වූහ. 1848 නිදහස් සටන මෙහෙය වූවෝ, ගොන්ගාලේගොඩ බණ්ඩා, දිනෙස්, පුරන්අප්පු හා ඩිංගිරාළ ආදීහුය. පළමුවන නිදහස් සටන මෙන් මෙම සටනේ භික්ෂු දායකත්වය ඍජුවම ප්‍රකට නොවුණත් ඒ පිළිබඳ දක්වා ඇති වාර්තාවලට අනුව අප්‍රකට තොරතුරු ඉතා සිත්ග න්නා සුලුය. එහිදි ගිරානේගම චන්ද්‍රජෝති නම් එවකට දඹුලු විහාරයේ අධිපති හිමියන්ගේ ක්‍රියාකලාපය ප්‍රශංසනීයයි. 1846 ජූලි 26 වැනිදා පෙ.ව. 11.30 යෙදුණු සුභ මුහුර්තයට අනුව ගොන්ගාලේගොඩ බණ්ඩා සිංහලේ අප්‍රකට අවසන් රජු ලෙස ඔටුනු පැළඳවීය. ගොලෑහෙළ රටේ මහතා විසින් සංවිධානය කළ මෙම අභිෂේක මංගල්‍ය සඳහා මහජනයා 400 පමණ සහභාගි වූහ. ශ්‍රී වික්‍රම සර්වසිද්ධිපි ලෙස අබිසෙස් ලැබූ රජ ඇතුළු පිරිසට එනම් දිනිස් උපරජු, ඩිංගිරාළ, සත්කෝරළයේ ඔටුනු නොපළන් රජු පුරන්අප්පු, සිංහලයේ රජුගේ අසිපත් දරන්නා ආදි පිරිස පන්සිල්හි පිහිටුවා අනුශාසනා ද පැවැත්වූයේ ගිරානේගම හිමියන් ය. සටන සඳහා උඩරටට පිටත් වූයේ ද පිරිත් සජ්ඣායනා මධ්‍යයේ ය. ගිරානේගම හිමියන්ට අමතරව 1848 නිදහස් සටනේ කැපීපෙනෙන චරිතය වූයේ කඩහපොල (කහල්ලේ, කුඩාපොල) හිමියන්ය. උන්වහන්සේගේ දායකත්වය පිළිබඳ දීර්ඝ විස්තරයක් ලේඛනාශ්‍රයෙන් සොයාගැනීම උගහටය. කුඩාපොල හිමියන් ලෙස හැඳින්වෙන්නේ ද උන්වහන්සේය. කැරැල්ල අසාර්ථක වීමත්

සමග කැරලිකරුවන් අල්වාගැනීමේ මෙහෙයුමක සිටි ඉංග්‍රීසීන්ට කඩහපොල හිමියන් පිළිබඳ ඉව වැටුණි. එම වර්ෂයේ අගෝස්තු මස 25 වැනිදා රාජ්‍යද්‍රෝහි වීමේ වරද යන චෝදනාව යටතේ සිවුරු දරා සිටිද්දීම මෙම හිමියන්ව වෙඩි තබා ඝාතනය කරන ලදි. මෙය ඓතිහාසික සිදුවීමක් ලෙස අතිශය හද කම්පාකරවයි. උන්වහන්සේගේ 1848 නිදහස් සටන සම්බන්ධයෙන් වන දායකත්වය පිළිබඳව යටත් විජිත යුගය පිළිබඳ ප්‍රවීන රචකයෙකු වන ආචාර්ය කේ.ඩී.ජී. විමලරත්න පවා ඔහුගේ 'ලංකාවේ බ්‍රිතාන්‍ය ආධිපත්‍ය', '1848 සිංහලේ නිදහස සටන' ආදී කෘතිවල ද දීර්ඝ විස්තරයක් දක්වා නැත. කෙසේ වුවත් ප්‍රසිද්ධියේ ඝාතනය කිරීමට තරම් උන්වහන්සේ රාජ්‍ය ද්‍රෝහියෙකු වූයේ නම්, ඉන් හැඟෙන්නේ 1848 සටනේ වටිනාම චරිතයක් ද වන්නට ඇති බවයි.

### යටත් විජිත යුගයේ භික්ෂු දේශපාලනය (1948 නිදහස දක්වා)

මෙම ලේඛනය පුරාවටම සාකච්ඡා කළේ භික්ෂු දේශපාලනයේ විවිධ අවධිවලට අදාළ සංසිද්ධි පිළිබඳවය. එහිදි ඉතිහාසයේ යම්ප්‍රමාණ තීරණාත්මක මොහොතක භික්ෂුව කෙසේ හැසිරුණේ ද යන්න අප 'දේශපාලනය' ලෙස ලඝු කොට දක්වන්නට විණි. 1505, 1662, 1796 යන විදේශීය ආක්‍රමණ නිසාවෙන් අතිශය පීඩාවට පත් මෙරට වැසියෝ හැකි සෑම විට ම නිදහස් රටක් වෙනුවෙන් හඬනැගුහ. අරගල කළහ. මෙම අරගලයේ පෙර මග වැඩියෝ භික්ෂූහුය. භික්ෂූන් හා යටත් වැසියන් කුපිත කර වූ තත්ත්වය නිර්මාණය වූයේ සුද්දන් විසින් උඩරට ගිවිසුම් ප්‍රකාර 05වැනි වගන්තිය උල්ලංඝණය කිරීමත් සමගිනි. එහි දැක්වෙන පරිදි, ''මෙකී රටවල්වල මුලාදෑනීන් සහ වැසියන් විසිනුත් අදහන්නා වූ බුද්ධශාසනය ද, දේවාගම ද කඩකළ නොහැකිව පවත්වන්නට ඕනෑවා සහ එහි කටයුතු ද සංඝයා වහන්සේලා ද විහාරස්ථාන ද දේවාල ද පවත්වන්නට සහ ආරක්ෂා කරන්නටත් ඕනෑය.'' බුද්ධාගම සම්බන්ධ බුද්ධශාසනය, විහාරස්ථාන සංඝයා පිළිබඳ නොසලකා සිටීමට සුදුපාලකයන්ට නොහැකි විණි. මෙහි දේවාගම දේවාල යන පදවලින් විහාරස්ථාන තදානුබද්ධ දේවාල පිළිබඳ කියැවෙන බව අප හැඟීමය. අදටත්

මෙරට බොහෝ විහාරස්ථාන ආශ්‍රිතව දේවාල පවත්වාගෙන යනු ලැබේ. විෂ්ණු, කතරගම, සමන්, උපුල්වන්, දැඩිමුණ්ඩාදි දෙවිවරුන් විෂයෙහි දේවාල ඉදිකොට ඒවා වන්දනා කරන්නේ බෞද්ධයන්මය. එය වෙනම ආගමක් ලෙස නොව සිංහල බෞද්ධ සංස්කෘතිකාංගයක් ලෙස සංවර්ධනය වී ඇති බව සිතිය හැකිය. ඒ අනුව බෞද්ධාගම සම්බන්ධ ආගමික උත්සව, පෙරහැර ආදිය පිළිබඳව ද සැලකිල්ලක් දැක්වීම සුදුපාලකයන් සතු වගකීමක් විය. මෙම වගකීම පැහැරහැරි සෑම අවස්ථාවක ම භික්ෂූන්ගෙන් හා බෞද්ධයන්ගෙන් විරෝධතා එල්ල විණි.

යටත් විජිත පාලකයින් බෞද්ධාගම මර්දනය කිරීම සඳහා පාවිච්චි කළ සූක්ෂම අවියක් ලෙස මිෂනාරී අධ්‍යාපනය හැඳින්විය හැකිය. සාම්ප්‍රදායික බෞද්ධාගමික අධ්‍යාපන රටාව ප්‍රතික්ෂේප කළ ඔවුහු පාසල, පල්ලිය ඇතුළත ගොඩ නැගූහ. වික්ටර් අයිවන්ට (පන්සලේ විප්ලවය, 2006 ) අනුව, 1868 වනවිට මෙරට පැවැති පාසල් සංඛ්‍යාව 915 කි. සෑම පාසලකම වාගේ අන්‍යාගම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක වූ අතර, ආගම ද ඉගැන්විණි. ජී. පොන්නම්බලම් රාමනාදන්ගේ ප්‍රකාශයක් උපුටා දක්වන, වික්ටර් අයිවන් දෙමළ ළමුන් පාසැල් යන විට නළලේ පොහොට්ටුව මකාගෙන ගිය බව සඳහන් කරයි. අධ්‍යාපනය මුවාවෙන් ඉංග්‍රීසීහු මිෂනාරී මෙහෙයුම් ක්‍රියාත්මක කළහ. තම යටි අරමුණු වෙනුවෙන් කෙතරම් වෙහෙසක් ඔවුන් විසින් යෙදවූවා දැයි යන්න 1911 ඩෙන්හැම් සංගණනයේ එන විස්තරවලට අනුව එකල පැවති ක්‍රිස්තියානිය ඇදහූවන්ගේ ප්‍රමාණය දැනගැනීමෙන් අවබෝධ කරගත හැකිය.

| | |
|---|---|
| රෝමානු කතෝලික | 339, 300 |
| එංගලන්ත සභාව (ඇන්ග්ලිකන්) | 41, 095 |
| ප්‍රෙස්බිටේනියන්වරුන් | 3, 546 |
| වෙස්ලියන්වරු | 17, 323 |
| ක්‍රොන්ග්‍රීශේවරුන් | 2, 978 |
| වෙනත් | 1, 620 |

ඉංග්‍රීසින් විසින් ස්වකීය ලබ්ධිය මගින් ක්‍රියාත්මක කළ මූලධර්මවාදී අධ්‍යාපන ක්‍රමයට ඍජුව විරුද්ධව නැගී සිටි හිමිනමකි දොඩන්දූවේ ශ්‍රී පියරතන. උන්වහන්සේ සිරිලක පළමු බෞද්ධ පාසල එනම් දොඩන්දූවේ පියරතන විද්‍යාලය ආරම්භකොට වරප්‍රසාද නොලත් බෞද්ධ දරුවන් වෙනුවෙන් අධ්‍යාපන අයිතිය පවරාදීමට කටයුතු කළහ. බ්‍රිතාන්‍ය පාලනය විසින් මෙහෙයවනු ලැබූ කතෝලික අධ්‍යාපනය ක්‍රමය පිළිබඳ සර් පොන්නම්බලම් රාමනාදන් මෙසේ දක්වයි.

''තමන්ට වෙන් වූ පාසල් නැතිහෙයින් මිෂනාරී පාසල්වලට ඇතුළත් වී සිටින හින්දු පිරිමි ළමයි මානසිකව වංචා කිරීමටත් වංක ලෙස හැසිරීමටත් පුරුදු වී සිටිති. ගෙදර පූජා පවත්වන විට නළලේ ගානු ලබන ශුද්ධ අළු ක්‍රිස්තියානි පාසල්වලට ළංවෙත්ම හොඳින් උලා පිසදමනු ලැබේ. පාසල තුළ ඔවුහු ක්‍රිස්තියානි සිසුන් ලෙස හැසිරෙති...'' පොන්නම්බලම් නොදුටු බෞද්ධ සිසුන්ගේ අද්දැකීම් කොතරම් ඛේදනීය වනු ඇතිද?

නිදහස කරා යන ගමනේදී භික්ෂු ක්‍රියාකාරිත්වය අතිශය ප්‍රබල කාරණාවක් ලෙස අධ්‍යයනය කළ යුතුය. එහිදී 1848 නිදහස් අරගලයෙන් දැඩි ලෙස මර්දනය වූ සිංහලයන් නැවත නොනැගිටින ලෙස මර්දනය කිරීමට ඉංග්‍රීසීහු උත්සුක වූහ. එසේ වුවත් බෞද්ධ භික්ෂුව තම ජාතික මෙහෙවරෙහි තත්පර වූයේය. දේශයේ යහපත වෙනුවෙන් තවත් ශක්තිමත් වූයේය.

1841 දී ආරම්භ කළ රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙන ලාංකේය ආරාමික අධ්‍යාපනයේ වැටුණු තැනින් නැගී සිටීමට ගත් උත්සාහයක ප්‍රතිඵලයකි. විද්‍යාලංකාර, විද්‍යෝදය පිරිවෙන් ආරම්භ වීමට ප්‍රථම වළානේ සිද්ධාර්ථ හිමියන් විසින් පිරිහී ගිය පිරිවෙන් අධ්‍යාපනය නගාසිටුවන ලදි. අධ්‍යාපනය සම්බන්ධයෙන් භික්ෂුවගේ ඍජු දායකත්වය මතුකර දක්වන්නේ, අධ්‍යාපනයේ දේශපාලනය ස්පර්ශ නොකරමින්, දේශපාලනය විසින් අධ්‍යාපනය විනාශකර තිබූ අවධියෙක පිරිවෙන් අධ්‍යාපනයේ උන්නතියට එඩිතරව දායක වූ බව පෙන්වා දීමටය.

මෙරට බෞද්ධ සමාජ දේහයේ තවත් කැපී පෙනෙන මොහොතක් ලෙස පුනර්ජීවන ව්‍යාපාරයේ මුලසිට අවසානය දක්වා කාලය හැඳින්විය හැකිය. අනගාරික ධර්මපාල, හෙන්රි ස්ටීල් ඕල්කට්, ඒ.ඊ. බුල්ජන්ස්, පොන්නම්බලම් රාමනාදන්, මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, හික්කඩුවේ සුමංගල හිමි වැනි ජාතිමාමක බලවේග නිර්මාණය වීමටත් ඒවායේ පැවැත්ම, සාර්ථකත්වය ආදිය සඳහාත් භික්ෂු දේශපාලනය ඍජුවම බලපෑ බව අප අදහසයි. ඔවුහු යම් දේශපාලනයක නිරත වූ අතර එය එක් ප්‍රධාන පොදු අරමුණක් වෙනුවෙන් පමණි.

**භික්ෂුව පක්ෂ දේශපාලනයට පිවිසීම (මෑත යුගය)**

ශ්‍රී ලංකාවේ පළමු දේශපාලන පක්ෂය වන්නේ, ලංකා සමසමාජ පක්ෂයයි. 1935 දී එම පක්ෂයේ ආරම්භක අවස්ථාවේ පටන්ම භික්ෂූහු ක්‍රියාකාරී වූහ. බලංගොඩ ආනන්ද මෛත්‍රේය, නරාවල ධම්මරක්ඛිත, බඹරැන්දේ සිරිසීවලී, කොටහේනේ ප්‍රඥාකීර්ති, යක්කඩුවේ ප්‍රඥාරාම, වල්පොල රාහුල වැනි හිමිවරු පක්ෂයේ ප්‍රසිද්ධ කථිකයෝ වූහ. මේ වන විට ඉන්දියාවේ ශාන්ති නිකේතනයට ගොස් අධ්‍යාපනය ලැබ මෙරටට පැමිණ සිටි උඩකැන්දවෙල සිරිසරණංකර හිමියන් ද ලාංකේය වාම දේශපාලනයේ ප්‍රතාපවත් භික්ෂු චරිතයක් විය.

මහින්දාගමනයත් සමග සංවර්ධනය වී ස්ථාවර වූ ලාංකේය භික්ෂුව සතු බලපෑම් කිරීමේ හැකියාව එක්තරා පක්ෂයක නමින් කරළියට පැමිණි පළමු අවස්ථාව ලෙස ලංකා සමසමාජ පක්ෂ දේශපාලනයේ භික්ෂු ක්‍රියාකාරීත්වය හඳුන්වාදිය හැකිය. එසේ වුවත් සන්දර්භමය වශයෙන් අවස්ථා දෙකක් වුවත්, පක්ෂයක නමක් නොමැතිව වුවත් ඉතිහාසයේ ද භික්ෂුව පෙනී සිටියේ දේශපාලන කාරණාවන් උදෙසා බව අප පෞද්ගලික හැඟීමයි. ඉතිහාසය විසින් එම කාරණා ඓතිහාසික කාරණා ලෙස කෞතුක වටිනාකමකින් වර්තමානයට ලබාදී ඇති අතර, මෑත යුගයේ පක්ෂ දේශපාලනයත් සමග එම භික්ෂු මැදිහත්වීම එතරම් නොවටිනා සාධකයක් වී ඇති බව අප දැනීමයි. ඇතැමෙකුට අනුව මෙහි ඇති විවේචනය පක්ෂයක් සමග ගනුදෙනු කිරීම

ම පමණි. සමහරෙක් එය සතර අගතියෙන් එකකට (ඡන්ද) පත්වීමක් ලෙසටත් විවේචනය කරති. පක්ෂ බිහිවන්නට ප්‍රථම කාලයේ පාක්ෂිකත්වය කෙරෙහි භික්ෂුව සතුව පැවති උනන්දුව ද දේශපාලනය සංසිද්ධියක් ලෙසට ම හඳුනාගැනීම යුක්ති යුක්ත බව අප හැඟීමයි.

වාමවාදී අදහස් දැරූ සරණංකර හිමියන් ඡන්දයකට ඉදිරිපත් වූ බවකට සාක්ෂ්‍ය සඳහන් නොවේ. රතු විප්ලවයේ සාධනීය අංශ ගැන ජනතාව දැනුවත් කළ උන්වහන්සේ 1938 මැයි 01 දින ගාලු මුවදොර පැවැති හමුවක දී කළ වේගවත් කතාව ඉංග්‍රීසි පරිපාලන පවා තිගැස්සීමක ලක් කිරීමට සමත් වූ බව සඳහන්ය. කහ සිවුර, රතු විප්ලවය, පරදේශක්කාර චින්තනය (මාක්ස්වාදය) ආක්‍රමණික බටහිර පාලනය මෙරටින් පලවා හැරීමට කෙසේ ගළපාගනු ද යන්න සාමාන්‍ය ජනතාවට පැවැති උභතෝකෝටික ප්‍රශ්නයක් විය. කරුණු එසේ වුවත් ලාංකේය භික්ෂුවගේ පක්ෂ දේශපාලනය සම්බන්ධයෙන් 'සරණංකර ලකුණ' නොමැකෙන සටහනකි. එමගින් ආරම්භ කළ භික්ෂු දේශපාලන භාවිතය අප සාකච්ඡාවට බඳුන්වේ.

සරණංකර හිමියන්ට අමතරව වල්පොල රාහුල හිමියන් ද මෙරට භික්ෂු දේශපාලනයේ වාමාංශික ලකුණක් ලෙස හඳුන්වාදීම උන්වහන්සේට සිදුකරන අගෞරවයක් නොවනු ඇත. ලංකා විශ්වවිද්‍යාලයක පළමු උපාධි අපේක්ෂක භික්ෂුව ලෙස ඉතිහාසගත වන උන්වහන්සේ, සාම්ප්‍රදායික භික්ෂු භූමිකාවෙන් ඉවත්ව, ඉංග්‍රීසි අධ්‍යාපනයටත්, ශිෂ්‍ය සංගම්වල කටයුතුවලටත් යොමුවන්නට විය. රාහුල හිමියන් අනුව යමින් හෝ විද්‍යාලංකාරය ඇසුර කරගනිමින් හෝ වාම දේශපාලනයේ භික්ෂු දායකත්වය ඉහළ අගයක මෙකල පැවතිණි. යක්කඩුවේ ප්‍රඥාරාම (1905-1986), කොටහේනේ ප්‍රඥාකීර්ති (1907-1971) බඹරැන්දේ සිරිසීවලී (1908-1985), නරාවිල ධම්මරතන හා ආනන්ද සාගර (පසුව කේයස්) වැනි විද්‍යාලංකාර භික්ෂූන්ගේ ඍජු මැදිහත්වීම භික්ෂු දේශපාලනයක අවශ්‍යතාව පැහැදිලිවම මතුකරන්නට යෙදුණි. එය යථාර්ථයක් බවට පත් කරමින් 1946 පෙබරවාරි 13 දින නිකුත් කරන්නට යෙදුණු විද්‍යාලංකාර පිරිවෙන් ප්‍රකාශනය මෙරට භික්ෂු

දේශපාලනයේ කඩයිමකි. එසේ වුවත්, නිදහසින් පසුව පක්ෂ දේශපාලනයට ප්‍රවිෂ්ට වූ කිසිදු භික්ෂුවක විසින් විද්‍යාලංකාර ප්‍රකාශනය ඇසුර කළ බවක් දක්නට නොලැබුණි. තවද උක්ත ප්‍රකාශනය වාම දේශපාලනයේ විලිරුදාවෙන් බිහි වූ සුජාත දරුවෙකු මිස වර්තමානයේ දක්නට ලැබෙන රතු විප්ලවවාදීන්ගේ කලවම් වමේ ව්‍යාපාර මෙන් අවජාතක සමාජවාදයක් නොවේ. අප එලෙස පවසන්නේ විද්‍යාලංකාර ප්‍රකාශනය නිසිලෙස අධ්‍යයනය කිරීමෙන් ඉනික්බිතිවය. ඔවුහු වාමවාදීහු වුවද සිංහල ජාතියත් බුද්ධාගමත් ගැන දැඩි අවධානයක් යොමු කළහ.

''සිංහල භික්ෂූන් වහන්සේ මුල්කාලයේ පටන්ම සිංහල ජාතියෙත්, සිංහල දේශයෙත්, බුද්ධ ශාසනයෙත් දියුණුව පිණිස පුරෝගාමීව ක්‍රියාකරමින්ම භික්ෂු ජීවිතය ගත කළ බව අමතක කළ නොහැකිය.'' (විද්‍යාලංකාර පිරිවෙන් ප්‍රකාශය, 1946)

සමස්තයක් ලෙස ගත් කළ විද්‍යාලංකාර ප්‍රකාශය දේශපාලන පක්ෂයක අනුරුවක් ලෙස නොපෙනේ. එම ප්‍රකාශනය සඳහා මුල් වූ භික්ෂූන් වහන්සේගේ, දේශපාලන ස්ථාවරය පසෙකලා බැලූ කල විද්‍යාලංකාර ප්‍රකාශය අතිශය ප්‍රගතිශීලි සමාජවාදී ප්‍රකාශනයකි. ඒ බැව් වඩාත් තහවුරු වන තැනකි එම ප්‍රකාශයේ අවසන් වචන කිහිපය.

''අන්‍යලබ්ධික විදේශීය ආණ්ඩුකාර පක්ෂ විසින් නොයෙක් උපක්‍රම බලයෙන් බොහෝ උත්සාහ කොට ගිහි-පැවිදි සම්බන්ධය ඈතිකරලීම පිණිස රටවැසියාගේ නොව තමන්ගේ ප්‍රයෝජනය තකා කරගෙන ගිය එම ව්‍යාපාර අනුගමනයකොට භික්ෂූන් සමාජයෙන් ඈත්කරලීමට උත්සාහ කිරීම කිසිසේ ම නොකළ යුතු දෙයකි. එසේම එය තම රටට ජාතියට ආගමට කරන ලද බරපතල අපරාධයකි. එහෙයින් අපේ භික්ෂූන් වහන්සේත් අපේ බෞද්ධ ප්‍රභූපක්ෂයත් සිහි බුද්ධියෙන් තොරව වැඩිදුර කල්පනා නොකොට ඉක්මන් වී ජාතිය හා ආගම පිරිහීමට මගපාදා නොගත යුතු බව ප්‍රකාශ කරම්හ.''

විද්‍යාලංකාර ප්‍රකාශය, ප්‍රකාශයක් මිස ඡන්ද පොරොන්දුවක් හෝ මැතිවරණ ප්‍රතිපත්තියක් නොවේ. එය භික්ෂූන්ට දේශපාලනය

කිරීමට යොදාගත හැකි බලපත්‍රයක් මෙනි. භික්ෂු ජීවිතයට කැළල් නොවන, රටවැසියන්ගේ යහපතට හේතුවන ඕනෑම වැඩපිළිවෙළක යෙදීම හා එය දේශපාලනය වුවත් එහි යෙදීම ද භික්ෂූන්ට ද සුදුසු බව මෙමගින් තරයේ අනුමත කර ඇත. පසුකාලීනව පක්ෂ දේශපාලනයේ යෙදුණු භික්ෂූහු විද්‍යාලංකාර ප්‍රකාශය පාදකසටහන් සඳහා යොදාගත්තා මිස සමස්ත ප්‍රකාශයේ ඇති වගන්ති නිසි ආකාරව අධ්‍යයනය නොකළ බව අප හැඟීමය. අද වමේ ව්‍යාපාරය නිරාගමිකව කටයුතු කරමින් භික්ෂුව ඉදිරිපෙළ පුටුවේ පමණක් වාඩිකොට තම ඔලුගෙඩි ප්‍රමාණය වැඩිකොට පෙන්වීමට උත්සාහ දරද්දී වමේ ව්‍යාපාරයේ මුල්කාලයේදී වම දකුණින් අපිරිසිදු වන්නට පෙර කටයුතු කළ ආකාරය ප්‍රසංසනීය බව වමේ බලවතුන්ගෙන් නිර්මිත විද්‍යාලංකාර ප්‍රකාශය මොනවට පැහැදිලි කරනු ඇත.

විද්‍යාලංකාර සලකුණෙන් පසුව ලංකා ඉතිහාසයේ කැපීපෙනෙන භික්ෂු දේශපාලන පියසටහන් එකතුවන්නේ නිදහසින් පසු යුගයේදීය. එනම්, 1947 බලයට පත් වූ ඩී.එස්. සේනානායකගේ එක්සත් ජාතික පක්ෂයට විරුද්ධවය. ඩී.එස්. සේනානායක ප්‍රධාන UNP පාක්ෂිකයන්ගේ අධිරාජ්‍ය ගැති ස්වභාවය සිංහල ජාතික බලවේග විෂයයෙහි යම් ප්‍රමාණ ද්වේශයක් ඇතිකරන්නට විණි. ඒ සඳහා ඓතිහාසික කාරණාවක් මගින් අවශ්‍ය පෙළඹවීම ලබාදුණි. එනම් 1956 යෙදුණු බුද්ධජයන්ති වර්ෂයයයි. 1956 මෙරට සිටි කැපීපෙනුණු භික්ෂු නායකත්වය නම් හේන්පිටගෙදර ඤාණසීහ හිමියන්ය. උන්වහන්සේ හා අගමැති ඩී.එස්. සේනානායක අතර පැවැතියේ කිට්ටු සම්බන්ධතාවකි. එසේ වුවත්, සේනානායකගේ දෙබිඩි පිළිවෙත් හමුවේ සිංහල බෞද්ධ නායකත්වයක් අවශ්‍ය විණි. ඒ සඳහා හේන්පිටගෙදර හිමියන්ගේ ඒකමතික යෝජනාව වූයේ එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක ය. ඒ වන විට Oxford සරසවියෙන් උපාධිය ලබා පැමිණ සිටි බණ්ඩාරනායකට භික්ෂූන්ගේ ආශීර්වාදය නොමදව ලැබුණි. 1956 අප්‍රේල් මස පැවති මැතිවරණයෙන් විශිෂ්ට ජයග්‍රහණයක් ලැබූ බණ්ඩාරනායක නායකත්වය දුන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (Sri Lanka Freedom Party) - SLFP ආසන 60 කින් ආසන පනස්

එකක් හිමිවිණි. 70 කට තරගකොට එජාපයට හිමිවූයේ ආසන 08 පමණි.

භික්ෂූන්ගේ කරමතින් ගොඩනැගූ බණ්ඩාරනායකගේ ආණ්ඩුවේ ද අර්බුද නොතිබුණා නොවේ. 'කතරට දියපොදක්' මෙන් දීර්ඝ කාලයක් පීඩනයට පත්ව සිටි බෞද්ධ බලවේග බණ්ඩාරනායකගේ ජයග්‍රහණයෙන් යම් අස්වැසිල්ලක් ලැබූ බව නොරහසකි. බණ්ඩාරනායකගේ මැතිවරණ ව්‍යාපාරය සම්පූර්ණයෙන් ම දියත් වූයේ බලවේග පහක් හරහාය. එනම් පංච මහා බලවේගය ලෙස සැලකූ 'සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු' යන බලවේග 05 යි. මෙම බලවේග අතුරින් ප්‍රබලම සාධකය වූයේ පළමු පාර්ශ්වයයි. මෙම සටනේ නායකත්වය ගත් භික්ෂූන් අතර හේන්පිටගෙදර ඥානසීහ, බද්දේගම විමලවංස, මාපිටිගම බුද්ධරක්ඛිත, කොටහේනේ ප්‍රඥාකීර්ති, දෙහිගස්පේ ප්‍රඥාසාර, තල්ගම සීලවංස, හැවැන්පොළ රතනසාර, දෙගම්මැද සුමනජෝති, වැල්ලවත්තේ ආනන්ද, මැදගොඩ සුමනතිස්ස වැනි හිමිවරු වෙති. පනස් හයේ විප්ලවයේ අපේක්ෂිත අරමුණු බණ්ඩාරනායක හරහා ඉටු වී ද යන්න දීර්ඝව සාකච්ඡා කළ යුතුය. කෙටියෙන්ම පැවසිය හැක්කේ, බණ්ඩාරනායකවත් ඔහුට බලයට ගේන්න වෙහෙස වූ භික්ෂු බලවේගයවත් අපේක්ෂා කළ බොහෝ දෑ මැතිවරණ ජයග්‍රහණයෙන් පසුව සිදු නොවූ බවයි. 'බණ්ඩාරනායක චෙල්වනායගම් ගිවිසුම' (Bandaranaike–Chelvanayakam Pact) වැනි සිදුවීම් එම අතෘප්තභාවයට මග කියාදුණි. එපමණකින් නොනැවතී ලෝකය හමුවේ 'භික්ෂුවක විසින් බණ්ඩාරනායක ඝාතනය කළා' (due to wounds received after being shot by Talduwe Somarama, a Buddhist monk – Ref: https://en.wikipedia.org/wiki/S._W._R._D._Bandaranaike) යන මනුස්ස විග්ගහ පාරාජිකාවට සමස්ත ලාංකේය භික්ෂුවට ම මුහුණපාන්නට විය. භික්ෂූන් දේශපාලනයට ඍජුව සම්බන්ධ වූ පළමු අවස්ථාව 1956 ලෙස හැඳින්විය නොහැකිය. අප දරන මතයට අනුව මිහිඳු හිමියන් විසින් සිදු කළේ ද දේශපාලනයකි. එය අද දේශපාලනය යනුවෙන් හඳුන්වන පටු ස්ථානයකින් නතර නොවුණු ක්‍රියාවලියකි. මෙම ක්‍රියාවලියේ දම්වැලට බැඳුණු පුරුක්

කිහිපයකි 1956 ලාංකේය භික්ෂුව. වෙනසකට තිබුණේ පක්ෂ බිහිව තිබීමයි. එසේම දේශපාලන, ආර්ථික පරිසරය වෙනස්කම්වලට භාජනය වී තිබීමත් ය. පනස් හයේ සිට අද 2018 දක්වා ගත වූ වසර ප්‍රමාණය වසර 62 කි. පනස් හයේ තරම් ජනබලයක් භික්ෂුවට තවත් දිනෙක ඇතිවේ යැයි සිතීමත් උගහටය. එදා ලැබූ දේශපාලන බලාධිකාරය හෝ භික්ෂු දේශපාලන සමාජ තත්ත්වය සිංහල බෞද්ධ ජාතිකවාදය සම්බන්ධයෙන් ඉහළ අගයකි. එසේ වුවත් ඇතැම් විවේචනවලට අනුව පනස් හයේ විප්ලවය හා සමගාමී සිදුවීම් මෙරට සිවිල් යුද්ධයකට පවා පාර කියා ඇත. ඔවුන්ට අනුව එමගින් කරළියට ආ 'භාෂා ප්‍රශ්නය' උතුරේ දෙමළ ඊළාම්වාදයක් දක්වා බලපා ඇත. මේ දෙස මධ්‍යස්ථව බලන විට අපට දැනෙන්නේ, දේශපාලකයන් විසින් පොදු ජනතා මතය හා ඔවුන්ගේ හැඟීම් අවභාවිත කර ඇති බවයි. ඒ හැර සිංහල බෞද්ධ විප්ලවයේ වැරද්දක් නොමැත. බලය ලැබූ කළ පාලකයා කටයුතු කරන්නේ තවදුරටත් ඔවුන්ගේ න්‍යායපත්‍රවලට අනුව මිස පාලිතයාට අනුව නොවේ.

ලාංකේය දේශපාලන ඉතිහාසයේ පක්ෂයක් හරහා පාර්ලිමේන්තු නියෝජනය කළ ප්‍රථම භික්ෂුව වූයේ බද්දේගම සමිත හිමියන්ය. උන්වහන්සේ, එවකට ලංකා සමසමාජ පක්ෂයේ හවුල්කාර පක්ෂයක් වූ ශ්‍රී ලංකා පොදු පෙරමුණ නියෝජනය කරමින් ගාල්ල දිස්ත්‍රික්කයෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කළේ 2001-2003 කාලයේදීය. සමිත හිමියන්ගේ දේශපාලන භාවිතය එතරම් ප්‍රගතිශීලී නොවූයෙන්, විශේෂයෙන් ජාතිකත්ව බලවේග සතුටු නොකරන ගමනක් වූයෙන් වසර දෙකක් වැනි කෙටි කාලයකින් පළාත් සභාවෙන් නතරවන්නට වුණි. දකුණු පළාතේ යම් ප්‍රමාණ දේශපාලන ක්‍රියාකාරිකයෙකු ලෙස අදත් සමිත හිමියෝ (2021 වර්ෂයේ අපවත් වූහ) කටයුතු කරති. එසේ වුවත්, සිංහල බෞද්ධ ජාතිකත්වය විෂයයෙහි කළ සුවිශේෂී සේවයක් 'සමිත' නම ඉදිරියෙන් සටහන් නොවේ.

පක්ෂ දේශපාලනය සම්බන්ධයෙන් ලාංකේය ඉතිහාසයේ තීරණාත්මක භික්ෂු භූමිකාව සිදුවන්නේ 2004 වර්ෂයේදීය. එනම් ජාතික හෙළ උරුමය නමැති නව ජාතික බලවේගය හරහාය.

ජාතික හෙළ උරුමය බිහිවීමට ප්‍රථම 2000 වසරේදී පැවති මහා මැතිවරණයට ඉදිරිපත් වූ සිහළ උරුමය පක්ෂය සැබවින්ම ජාතික හෙළ උරුමයේ මව් පක්ෂයයි. 2000 වර්ෂයේදී ඡන්ද 127,860 ලබා ගනිමින් එක් පාර්ලිමේන්තු අසුනකට හිමිකම් කියූ සිහළ උරුමය, තම ජනප්‍රියත්වය ශේෂ කරගන්නට විය. තම පක්ෂයේ අවසන් හුස්ම ටික ආරක්ෂා කරගැනීමට ඔවුන් ගන්නා ලද තීරණයකට අනුව සිහළ උරුමය නම් පක්ෂය ගිහි නායකත්වයෙන් යුත් තම පක්ෂයෙන් එළියට අවුත්, බෞද්ධ භික්ෂූන් ප්‍රමුඛ ජාතික හෙළ උරුමය නම් පක්ෂයට තම පක්ෂය පූජා කරන්නට විය.

2004 වසරේ පෙබරවාරි මස බිහිවූ ජාතික හෙළ උරුමය නම් දේශපාලන පක්ෂය බිහිවන්නේ 2004 අප්‍රේල් පවත්වන්නට යෙදුණු මහ මැතිවරණය ඉලක්ක කරගනිමිනි. ජාතික හෙළ උරුමය බිහිවීමේ ප්‍රබලතම සමාජ සාධකය වූයේ හදිසියේ අපවත් වූ ගංගොඩවිල සෝම හිමියන් ය. විචාරකයන්ට අනුව 80 දශකයේ මෙරට ජනප්‍රියතම භික්ෂු චරිතය වූ පානදුරේ අරියධම්ම හිමියන්ගෙන් පසුව, ලාංකේය ජන සමාජයේ ආකර්ශනීයම ධර්ම දේශකයා වූයේ ගංගොඩවිල සෝම හිමියන් ය. වඳ වී යන සිංහල ජාතිය වන්ද්‍යකරණයෙන් මුදවා ගැනීම, කුසීත සිංහලයන් අවදි කිරීම, සිංහල ව්‍යාපාර සක්‍රීය කිරීම, උතුරු නැගෙනහිර විනාශවන පුරාවස්තු මංකොල්ලය නතර කිරීම, රට කරවීමට සිංහල බොදු නායකයෙකුගේ අවශ්‍යතාව, මිත්‍යා විශ්වාස අතහැර බුද්ධිය අවදිකිරීම ආදිය උන්වහන්සේගේ කාලීන ධර්ම දේශනා මාතෘකා විය. ඒ හැම දේශනාවකම සියුම් උපහාසයක් හා ආදරණීය අවධානයක් මතුකිරීමට තරම් උන්වහන්සේගේ භාෂාව ව්‍යක්ත විය. ඒ නිසාම සෝම හිමියන්ගේ අපවත්වීම ජාතික හෙළ උරුමයේ පාර්ලිමේන්තු ආගමනයේ ආසන්න සිදුවීම ලෙස සැලකීම විවාද රහිත ය.

සෝම හිමියන්ට ජීවත්ව සිටියදී ඉටුකිරීමට නොහැකි වූ බොහෝ කාරණා ඉටුකරනු වස් ජාතික හෙළ උරුමය (ජාහෙඋ) මෙරට බෞද්ධ ජනතාවගෙන් පාර්ලිමේන්තු වරමක් ඉල්ලා සිටියේය. දින 48 වැනි කෙටි කාලයකින් බිහිවූ පක්ෂයක් ලෙස ජාහෙඋ තම ආකර්ශනීය මැතිවරණ ව්‍යාපාරය මගින් මධ්‍යම

පාංතික සිංහල බෞද්ධ ප්‍රජාව වහා වසඟ කරගන්නට විය. 210 ක් පමණ ඉදිරිපත් වූ අපේක්ෂකයන්ගෙන් පාර්ලිමේන්තු වරම් ලබාගත්තේ භික්ෂූන් 09 ක් පමණි. ඡන්ද පන්ලක්ෂ පනස් දෙදහස් හත්සිය විසි හතරක් පක්ෂයට ලැබුණි. එය වලංගු ඡන්ද සංඛාවෙන් 6% පමණ ප්‍රතිශතයකි. මැතිවරණ කොට්ඨාස අනුව මන්ත්‍රී ආසන 07ක් ද ජාතික ලැයිස්තුවෙන් ආසන දෙකක් ද වශයෙන් මන්ත්‍රී අසුන් 09ක් හිමිකර ගත්තේය.

ජාතික හෙළ උරුමයට ඡන්දය සඳහා පැවතියේ ඉතා සීමිත කාලයකි. තවද ධර්ම රාජ්‍යයක් සඳහා පාරමිතා පෙළහර නමැති ඔවුන්ගේ මැතිවරණ තේමාව බහුලව ව්‍යාප්ත වූයේ නාගරික මධ්‍යම පාන්තික ධනවත් ප්‍රජාවක් කරා පමණි. ගමට ජාතික හෙළ උරුමයේ පණිවුඩය සන්නිවේදනය වූයේ සෙමිනි.

**ජාතික හෙළ උරුමය - 2004 මහා මැතිවරණය**

**තේරී පත් වූ මන්ත්‍රී භික්ෂූන් වහන්සේ**

| දිස්ත්‍රික්කය | නම | ලබාගත් මනාප සංඛාව |
|---|---|---|
| කොළඹ | උඩුවේ ධම්මාලෝක හිමි | 42, 850 |
| | කොටපොල අමරකිත්ති හිමි | 26, 539 |
| | කතළුවේ රතනසීහ හිමි | 10, 512 |
| ගම්පහ | කොළොන්නාවේ සිරිසුමංගල හිමි | 25, 154 |
| | අපරැක්කේ පඤ්ඤානන්ද හිමි | 7389 |
| කළුතර | අතුරලියේ රතන හිමි | 10, 772 |
| මහනුවර | උඩවත්තේ නන්ද හිමි | 10, 846 |
| | එල්ලාවල මේධානන්ද හිමි | ජාතික ලැයිස්තුවෙන් |
| | ඕමල්පේ සෝභිත හිමි | තේරී පත්වුණ |

හෙළ උරුමයේ ඡන්ද පදනම විකාශනය වී තිබුණේ කොළඹ, ගම්පහ, කළුතර හා මහනුවර වැනි දිස්ත්‍රික්කවල නාගරික මධ්‍යම පාන්තික ප්‍රජාවක් අතර පමණි. මුලින් සඳහන් කළ පරිදි ජාතික හෙළ උරුමය ගමට හෝ ඓතිහාසික අනුරාධපුර, පොළොන්නරු රාජධානිවලට සංසරණය වී නොතිබුණි. එහිදී 'සෝම හිමි' සාධකයට අමතරව, ඡන්දයට ඉදිරිපත් වූ අපේක්ෂකයන්ගේ පෞද්ගලික ජනප්‍රියත්වය ද යම් සාධකයක් වන්නට ඇතැයි අප හැඟීමයි.

මින් මතුවට ජාතික හෙළ උරුමයේ දේශපාලන ජීවය සමාජ අවශ්‍යතාවන් හඳුනාගත්ත ද නැද්ද යන්න කෙරෙහි අප අවධානය යොමුවනු ඇත. හෙළ උරුමයේ මූලිකම පක්ෂ තේමාව වූයේ, 'ධර්ම රාජ්‍යයක්' අරමුණු කරගෙන දේශපාලනය මෙහෙයවීමයි. ඒ සඳහා තම පක්ෂ අරමුණු හෝ ප්‍රතිපත්ති 10ක් ඉදිරිපත් කෙරිණි.

I. ආගම් හා ඇදහිලි
II. රාජ්‍යයේ ආරක්ෂාව
III. ජාතික අයිතිය
IV. රාජ්‍ය පරිපාලනය
V. සංවර්ධන රටාව
VI. ආර්ථිකය
VII. සමාජය
VIII. අධ්‍යාපන ක්‍රමය හා මාධ්‍ය ප්‍රතිපත්තිය
IX. රාජ්‍ය තුළ භික්ෂුව
X. විදේශ ප්‍රතිපත්තිය

(උපුටා ගැනීම: දෑ හසුන, සුබෝධ පදනම, පේරාදෙණිය, 2005 අප්‍රේල්).

පැරණි බෞද්ධ මූලාශ්‍රය ඇසුරු කරමින් සක්ස් වූ හෙළ උරුමයේ ප්‍රතිපත්ති සැබවින්ම යහපත් සමාජ දේශපාලන ක්‍රමයකට වටිනා මගපෙන්වීමකි. තවද ඔවුන් අපේක්ෂා කළ පරිදි සිංහල බෞද්ධ රාජ්‍යයක ආරක්ෂාව හා අන්‍ය ජාතිකයන්ගේ

නිදහස වෙනුවෙන් හඳුන්වා දුන් 'ආගම් හා ඇදහිලි' වගන්තිය කලෝචිතය. 'ආර්ථිකය' සම්බන්ධ ප්‍රතිපත්තිය මගින් වුවද ඔවුන් හඳුන්වා දුන්නේ පැරණි ග්‍රාමීය කෘෂිකාර්මික ජීවන ක්‍රමයයි. 'රාජ්‍ය තුළ භික්ෂුව' යන 9වන ප්‍රතිපත්ති ප්‍රකාශය මගින් හඳුන්වා දුන්නේ, ධර්ම සංගායනාවක් සිදුකර, සිංහල භික්ෂු සංස්ථාව නැවත ස්ථාපිත කිරීමයි.

මෙම සියලු ප්‍රතිපත්ති අතුරින් හෙළ උරුමයට ඉටුකරගැනීමට හැකි වූයේ දශමයෙනුත් භාගයක් පමණ අරමුණු කිහිපයකි. ඒ සඳහා විවිධ හේතු කාරණා ඍජුව හෝ වක්‍රව බලපෑ බව සත්‍ය කාරණාවකි. ජාතික හෙළ උරුමයේ අසාර්ථක මෙහෙයුම මෙසේ පෙළ ගැස්විය හැකිය.

**ජාතික හෙළ උරුමයේ අසාර්ථකත්වයට බල පෑ හේතු**

- ජාතික දේශපාලනය කෙරෙහි ඔවුන් සතුව පැවති අල්ප දේශපාලන දැනුම
- විපක්ෂයේ පක්ෂයක් නිසා ම විඳින්නට වූ ප්‍රායෝගික හිරිහැර බාධක හා විවේචන
- විශේෂයෙන් ජනතා විමුක්ති පෙරමුණෙන් එල්ල වූ අභියෝගය. පැරණි ජවිපෙ (අද නොවේ) ස්ථාවරව පැවතියේ සිංහල සමාජ ක්‍රමයේ ජාතික බලවේග සමගිනි. එහිදී ජාතික හෙළ උරුමයේ ආගමනය ඔවුන්ගේ දේශපාලන සුජාතභාවයට අතුල් පහරක් විය.
- සම්මුතියක් ලෙස පිහිටා කටයුතු නොකිරීම. විශේෂයෙන් 13 වන පාර්ලිමේන්තුවේ කතානායකවරයා තෝරන ඡන්දයේදී හෙළ උරුමයේ හැසිරීම දැඩි දේශපාලනික ළදරු ස්වරූපයක් පෙන්නුම් කෙරිණි.

සිහළ උරුමය නමැති තම පක්ෂය ජාතික හෙළ උරුමයට පූජා කළ තිලක් කරුණාරත්න, තම පරිත්‍යාගයෙන් සෑහීමට පත් නොවී එක්සත් ජාතික පක්ෂය සමග අත්වැල් බැඳ ගැනීම හා සිංහල ජාතිකත්වය වෙනුවෙන් තවදුරටත් පෙනී නොසිටීම.

භික්ෂුව ක්‍රියාකාරී දේශපාලනයට යොමුවීම හා තදනුබද්ධ සංසිද්ධි දෙස විචාරශීලීව බැලූ පිරිස විසින් ඔවුන්ගේ දේශපාලන නැගී සිටිම ප්‍රසිද්ධියේ විවේචනය කිරීම.

- සාමාන්‍ය මහජනතාව (විචාරකයන් නොව) භික්ෂූන්ගේ පක්ෂ දේශපාලනය පිළිකුලෙන් යුතුව හෙළා දැකීම
- ජාතික හෙළ උරුමය ජාතියට ලබා දුන් ජයග්‍රහණ
- පසුකාලයේදී පාර්ලිමේන්තුව තුළ ස්වාධීනව කටයුතු කිරීමෙන් ලබා දුන් පූර්වාදර්ශය
- ජාතික ප්‍රතිපත්ති සුරැකීම විෂයෙහි දැක් වූ පරමාදර්ශී (ideal) ස්වභාවය.
- සුනාමි ඒකාබද්ධ යාන්ත්‍රණයට විරුද්ධ වීම
- ඊළාම් යුද්ධය නිමකිරීම වෙනුවෙන් සිදුකළ කැපකිරීම
- බලහත්කාරයෙන් ආගමට හරවාගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත දෙවනවර පමණක් කියවීමට සීමා වුවද ඒ සඳහා ආචාර්ය ඕමල්පේ සෝභිත හිමියන් දැක් වූ උත්සාහය අගය කළ යුතුය
- පොදු ස්ථානවල මත්පැන් හා දුම්වැටි භාවිතයට එරෙහිව ගත් ක්‍රියාමාර්ග සාර්ථක වී ඇත
- රටේ ජාතික අර්බුද හමුවේ රැස්වීම්, සාකච්ඡා, මාරාන්තික උපවාස, අධිෂ්ඨාන පූජා, සාමකාමී පා ගමන් වැනි විකල්ප ක්‍රම මගින් බලපෑම් එල්ල කිරීම

මේ 2018 වර්ෂයයි. ජාතික හෙළ උරුමයේ උපත සිදු වී අදට වසර 14 කි. දැන් මේ රටේ ජාතික හෙළ උරුමයක් දක්නට නැත. අවසන් මොහොත දක්වා ක්‍රියාකාරීව සිටි පාඨලී චම්පික රණවක, අතුරලියේ රතන හිමි ආදීහු ද පසුගිය මහ මැතිවරණයට තරඟ කළේ එක්සත් ජාතික පක්ෂය යටතේ ය. එහිදී එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිමය කාරණාවක් නිසා, රතන හිමියන්ට ඡන්දය ඉල්ලීමට නොහැකිය. එනමුත් ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රී අසුන දැරිය හැකිය. එජාපය පවසන පරිදි බෞද්ධයින්ගේ යහපත වෙනුවෙන් ඔවුන්ගේ පක්ෂය කිසි දිනෙක භික්ෂුවට අපේක්ෂකත්වය

ලබා නොදේ. එසේ වුවත්, අන්‍ය ලබ්ධික පූජකයන් නොවූවත්, දැඩි මතධාරී මූලධර්මවාදීන්ට ඒ සඳහා අවස්ථා ලබා දී ඇත. කෙසේ වුවත් අද වන විට රතන හිමි ස්වාධීන රාමුවක සිට එජාපය ද ජාතික හෙළ උරුමය ද තමන් වහන්සේදෝ හෝයි සිතා කටයුතු කරන බවක් පෙන්නුම් කරයි. ජාතික හෙළ උරුමයේ කඩා වැටීමට රතන හිමියන්ගේ හා වර්තමාන නායක ඕමල්පේ සෝභිත හිමියන්ගේ නිහඬ පිළිවෙත් බලපා ඇති බව අප හැඟීමයි. එහි එකම ක්‍රියාකාරී දේශපාලන සත්ත්වයා වන්නේ අමාත්‍ය පාඨලී චම්පික රණවකය. ඔහුද හෙළ උරුමයෙන් නොව එජාපයෙන් තරඟ කර, පාර්ලිමේන්තු අසුන දිනාගත්තෙකි. මේ අනුව අද වන විට ජාතික හෙළ උරුමයට 'අල්ලපු අත්තත්, පය ගහපු අත්තත්' නොමැත. එය දේශපාලන ඉන්ද්‍රියයන්ට අනුව සියුම් උපහාස රසයක් මතුකළ ද ජාතියක් හැටියට අභාග්‍ය තත්ත්වයකි. එහි ඇති අවාසිය නම් නැවත භික්ෂු බලවේගයක් කෙරෙහි ජනතා ආකල්පය සුභවාදීව හසුරුවන්නට නොහැකි වීමය. උගත්, නූගත්, ඉහළ මධ්‍යම පාන්තික දේශපාලන සත්ත්වයන් සියලු දෙනාට ම අනුව ජාතික හෙළ උරුමය තවත් එක් කෞතුක පක්ෂයක් පමණි. එහි වලංගුතාවක් ඉදිරියට නොමැත.

මහාචාර්ය නලින් ද සිල්වා මේ සම්බන්ධයෙන් දක්වා ඇති අදහස එක්තරා ප්‍රාමාණික විචාරයකි. ''අද ඇතමුන් කියන්නේ මැති ඇමතිවරුන් භික්ෂූන් වහන්සේගේ අවවාද අනුශාසනාවලට කන් නොදෙන බැවින් උන්වහන්සේ ම මැති ඇමතිවරුන්ගේ කාර්යභාරය ද කළ යුතු බවය. අද මැති ඇමතිවරුන් භික්ෂූන් වහන්සේට කන් නොදෙන්නේ නම් අප කළ යුත්තේ එයට හේතු කවරේ දැයි සොයා බලා ඒ හේතු නැති කිරීමට ක්‍රියාකිරීමට මිස තත්ත්වය අවුල් කිරීම නොවේ. (නලින් ද සිල්වා, මැතිවරණය හා හාමුදුරුවෝ, චින්තන පර්ෂදය, මහරගම, 2004, 10 පිටුව)

හෙළ උරුමයේ දේශපාලන භාවිතය විවේචනය කරද්දී, ඇතමෙක් එය යුග අවශ්‍යතාවක් ලෙස සලකත්. සමහරු බද්දේගම සමිත හිමියන් පාර්ලිමේන්තුවේ සිටිය දී විවේචනය නොකර හෙළ උරුමයේ භික්ෂූන් පමණක් විවේචනය කිරීම පිළිබඳ ප්‍රශ්න නැගූහ. කෙසේ වුවත් මෙම සියලුම සිදුවීම් එම කාලයට අදාළව

විමසීමෙන් යුක්ති අයුක්ති ස්වභාවය විමසිය හැකි බව අප දැනීමයි. සමකාලීනව සිදු වූ සෝම හිමි අභාවය ඒ සඳහා ප්‍රබල අභිප්‍රේරණයක් වුණි. උන්වහන්සේ අපවත් නොවන්නට, ලාංකේය දේශපාලන ඉතිහාසයේ ජාතික හෙළ උරුමක් ගැන සඳහන් නොවන්නට ඉඩ තිබුණි. බොහෝ විට මෙරට දේශපාලන ක්‍රමය, දේශපාලන විඥානය නිර්මාණය වී ඇත්තේ පුද්ගල සාධක මත යැයි පැවසීම දඬුවම් ලැබිය හැකි වරදක් නොවනු ඇත. 'පුද්ගල සාධකය' නිමාවීමත් සමග අරමුණු, අභිප්‍රේතාර්ථ ද අභාවයට යාම සාමාන්‍ය ස්වභාවයයි. ලාංකේය දේශපාලන ක්‍රමය ඇතුළත දෙවන පෙළ ශක්තිමත් කිරීමක් හෝ කරවීමක් දක්නට නොමැති තරම්ය. බොහෝ අරමුණු ඥාතිත්වය, වර්ගවාදය, ගුරුකුලවාදය යන ළාමක එළඹුම් මගින් ඉදිරියට ගමන්කරයි. එහිදී පෞද්ගලික න්‍යායපත්‍රවලට අනුව පාලනය මෙහෙය වනු විනා, ජාතික ප්‍රතිපත්ති බොහෝ අනුහස් නායකයන්ට (Charismatic Leaders) පවා නොමැත. එය දේශපාලන ස්ථාවරත්වය පිළිබඳ මෙරට ඉදිරියටත් මුහුණ දෙන ගැටලුවකි.

මෙම ලිපිය ලියන, 2018 වර්ෂයේ පළාත් පාලන ආයතන පිළිබඳ මැතිවරණය නිමා වී ඡන්ද උණුසුම ඉතිරිව පවතින අවස්ථාවයි. අවසන් ඡන්ද ප්‍රතිඵලයට අනුව 44 වඩා බලයක් හිටපු ජනාධිපති පා.ම. මහින්ද රාජපක්ෂ මහතා මෙහෙයවනු ලැබූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ලබා ඇත. 'නෙළුම් පොහොට්ටුව' ලකුණ යටතේ මාස දහයකට ආසන්න කෙටි කාලයක් ඇතුළත, ඡන්දයට ඉදිරිපත් වූ ශ්‍රීලපොජපෙ ලැබූ ජයග්‍රහණය සැලකිය යුතු කරුණක් වන අතර 1947 සිට පක්ෂ දේශපාලනයේ සිටින එක්සත් ජාතික පක්ෂය ලැබූ පරාජය ද සුළුපටු එකක් නොවනු ඇත. එය 2004 දී ජාතික හෙළ උරුමය කරළියට ගෙනා 'සෝම හිමි සාධකය' මෙන්ම සමානතාවක් වන්නේ, මහින්ද රාජපක්ෂ මෙරට තිස් වසරක ඊළාම් යුද්ධය නිමාවට පත් කරන විට විධායක ජනාධිපති වීමත් සිංහල බෞද්ධ කඳවුර නියෝජනය කරන පාර්ශ්වීය ලක්ෂණ ඔහු කෙරෙන් තවමත් දක්නට ලැබීමත් නිසාය. අපට කියන්න අවශ්‍ය වන්නේ, මෙම පළාත් පාලන මැතිවරණයට ද සැලකිය යුතු භික්ෂු පිරිසක් ඉදිරිපත් වීම සැලකිය

යුතු සාධකයක් බවයි. එහිදී ජාතික හෙළ උරුමයේ බිඳුණු උරුමය, සිංහලත්වය ආරක්ෂා කරනු වස්, පිවිතුරු හෙළ උරුමය හරහාත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හරහාත් බොහෝ භික්ෂූන් දේශපාලනයට ඉදිරිපත් වුණි. පුවත්පත් වාර්තාවලට අනුව ජය ලැබූ භික්ෂූන් ගණන 26කි. එය එක්තරා සුවිශේෂී කාරණාවකි. එම භික්ෂූන් ගම්වල ජනප්‍රිය ද නැද්ද යන්නට වඩා කලින් කී 'මහින්ද සාධකය' ඔවුන්ගේ ජයග්‍රහණයට ඍජුව බලපෑ බව අප හැඟීමයි. මෙම භික්ෂූන්ගේ දේශපාලන ගමන ප්‍රාදේශීය සභාවෙන් ඉවර වෙන්නට හෝ පාර්ලිමේන්තුව දක්වා ගමන් කරන්නට ඉඩ ඇත. ඒ සඳහා පුරෝකථන කීම අප කාර්ය නොවේ. එසේ වුවත්, එම භික්ෂු දායකත්වය මෙරට දේශපාලන ඉතිහාසයේ කිසියම් සලකුණක් තබාවී යන්න අප අවබෝධයයි.

භික්ෂූන්ගේ පක්ෂ දේශපාලනය සම්බන්ධ අර්බුද නිරවුල් කරනු වස් අප යෝජනා

1. සියලුම ප්‍රාදේශීය සංඝ සභාවල කටයුතු සක්‍රිය කිරීම
2. සියලු නිකායයන්ට අදාළව ප්‍රාදේශීය සංඝ සභා පිහිටුවා ඒවා මගින්, පවතින සමාජ, දේශපාලන තත්ත්වය කෙරෙහි ද අඩුම වශයෙන් පැයක් දෙකක්වත් සාකච්ඡා කර දේශපාලන දැනුවත්භාවය ඇති කරගැනීම
3. ඊනියා අධිකරණ නායක, සංඝ නායක, උපප්‍රධාන සංඝනායක තනතුරු බලාත්මක කර, නිලතල ප්‍රකාර බලතල පැවරීම, එහිදී මරණාසන්න හිමිවරුන්ට නායක තනතුරු නොදී, වැඩ කළ හැකි විනයධර භික්ෂූන් සඳහාම පමණක් ප්‍රමුඛතාව ලබා දෙනු මැනවි
4. භික්ෂු දේශපාලනය හා භික්ෂූන්ගේ පක්ෂ දේශපාලනය පිළිබඳ යම් ප්‍රමාණ විද්වත් සාකච්ඡාවක් හෝ සංවාදයක් පවත්වා ඉතිහාසයෙන් උගත්, වර්තමාන පණිවුඩ පිළිබඳ දැනුවත් කරවීම
5. භික්ෂුව, දේශපාලන බලපෑම් කණ්ඩායමක් ලෙස පමණක් කටයුතු කිරීමට එකඟතාව ඇති කර ගැනීම

6. එම බලපෑම් කණ්ඩායම්වලට ගිහි දේශපාලන විශ්ලේෂකයන් ද එකතු කර ගැනීම
7. නායකත්වය, මග පෙන්වීම නොලබමින් හැල්මේ දුවන වර්තමාන තරුණ සංඝ සමාජය වගකියන නායකත්වයක් යටතට පත් කරවීම
8. පිරිවෙන් විෂය නිර්දේශවලට දේශපාලන සමාජ විඥානය පිළිබඳ හා පුරවැසි අධ්‍යාපනය පිළිබඳ විෂය නිර්දේශ හඳුන්වා දීම
9. ප්‍රාචීන අධ්‍යාපනය ඉනික්බිතිව උසස් පෙළ කඩ ඉම' ලෙස නව පිරිවෙන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.
10. විශ්වවිද්‍යාලයේදී අනියමින් ලබන වාම දේශපාලන අත්දැකීම් හා ජුගුප්සාජනක කඳවුරු පුහුණුව නතර කරවීම.
11. කිසිඳු පක්ෂයකට යටත්ව, ඡන්දය ඉල්ලීමට නොහැකි වන පරිදි නිකායාන්තරික නීති සැකසීම
12. දේශපාලන පක්ෂවල උපදේශක තනතුරු, දැත් සවිමත් කිරීමේ කඳවුරු ආදියෙන් භික්ෂුව ඉවත් වීම
13. දේශපාලකයා හෝ මන්ත්‍රීවරයා තමා ළඟට ගෙන්වා ගැනීම විනා ඔවුන් පිටුපස භික්ෂුව ගමන් නොකිරීම යන භික්ෂු ආකල්පය හෙරණ අවධියේ සිට ලබාදීම
14. ආචාර්ය - උපාධ්‍යාය භූමිකාව බලසහිත කිරීම

අප විසින් ඉහත යෝජනා ඉදිරිපත් කරන්නේ සංඝ සමාජයේ මතු පැවැත්මේ ආයුෂ දවසකින් හෝ දීර්ඝ කිරීමට විනා ද්වේශ සහගතව නොවේ. ඉතිහාසයෙන් අප උගත් පාඩම් බොහෝය. වර්තමානයෙන් ඉගෙනීමට ඇති පාඩම් ද අපමණය. වර්තමානය ඉතිහාසයක් වන්නේ, අනාගතයේදීය. එවිට අශ්වයා පැනගොස් හමාරය. ඉස්තාලය වසා දමා පලක් නැත. ලාංකේය සංඝ සමාජයේ නූතන දේශපාලන භාවිතය පිළිබඳ, සමාජය (අප ද ඇතුළුව) දරන්නේ, සුභවාදී ආකල්පයක් නොවේ. එම

ආකල්පය සැඟවුණු න්‍යායපත්‍ර නැති සාතිශය සුළුතරයකගේ මධ්‍යස්ථ අදහසයි. දේශපාලනයේ දී ගිහියා කොහොමටත් භින්නරුචිකය. භික්ෂුවගේ කරමතින් ගොස් හෝ ඔවුන්ට අවශ්‍ය වන්නේ, දේශපාලන ප්‍රභාව ලැබීමය. භික්ෂුව එසේ නොවිය යුතුය. හෙතෙම මහණ වූදා පටන්ම ප්‍රභාව ලබයි. ගරු බුහුමන් ලබයි. දේශපාලනයෙන් ලබන අමුතු ප්‍රභාවක් නැත. උපද්දවා ගන්නේ අනවශ්‍ය පිළිකුලක් පමණි.